# ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ පාවිච්චියෙන් පසු අයෝග්‍ය කරන ලද පහත සඳහන් රථ වාහන/පොදුභාණ්ඩ ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකායන්හිදි ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් විකිණීමට ඉදිරිපත් කෙරේ

**ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිලිබඳ විස්තර හා අදාල ප්‍රසම්පාදන කොන්දේසි**

1. **ප්‍රසම්පාදන කාලසටහන** (සති අන්ත දින හා රජයේ නිවාඩු දින හැර)

| ස්ථානය | වාහන/පොදු භාණ්ඩ | රථ වාහන/පොදු භාණ්ඩ ලොට් අංක | අයදුම්පත් ඉදිරිපත් කල හැකි කාලසීමාව | ප්‍රසම්පාදනය විවෘත කරන දිනය හා වේලාව |
|---|---|---|---|---|
| 1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය යුද්ධ හමුදා කඳවුර, පනාගොඩ, හෝමාගම | ට්‍රක් රථ, ප්‍රයිම්මුවර්, බස් රථ, ඩබල්/සිංගල් කැබ්, කාර් රථ, ජීප් රථ, ධාවනපැදි, ට්‍රැක්ටර්, බවුසර් ටේලර්, අත් ට්‍රැක්ටර් ටේලර්, ත්‍රි රෝද රථ | 01 සිට 74 දක්වා (වාහන) | 2018.07. 16 දින 0900 පැයේ සිට 2018.08.01 දින 1000 පැය දක්වා | 2018.08.01 දින 1030 පැයට |
| | | 01 සිට 23 දක්වා (පොදු භාණ්ඩ) | 2018.07. 16 දින 0900 පැයේ සිට 2018.08.02 දින 1000 පැය දක්වා | 2018.08.02 දින 1030 පැයට |
| 2 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය යුද්ධ හමුදා කඳවුර, රණසේවාපුර, අනුරාධපුර | ලොරි රථ, ට්‍රක් රථ, ඩබල්/සිංගල් කැබ්, ජීප් රථ, ට්‍රැක්ටර් රථ, ජල බවුසර්, අත් ට්‍රැක්ටර් ටේලර්, ධාවන පැදි, බස් රථ | 01 සිට 62 දක්වා (වාහන)<br>01 සිට 08 දක්වා (පොදු භාණ්ඩ) | 2018.07. 16 දින 0900 පැයේ සිට 2018.07.30 දින 1000 පැය දක්වා | 2018.07. 30 දින 1030 පැයට |
| 3 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය යුද්ධ හමුදා කඳවුර, මහසෙන්පුර, මින්නේරිය | ට්‍රක් රථ, කැබ් රථ, ට්‍රැක්ටර් රථ, ට්‍රැක්ටර් ටේලර්, ධාවන පැදි, බස් රථ අත් ට්‍රැක්ටර් ටේලර්, ත්‍රි රෝද රථ, අත් ට්‍රැක්ටර්, ජල බවුසර් | 01 සිට 32 දක්වා (වාහන)<br>01 සිට 08 දක්වා (පොදු භාණ්ඩ) | 2018.07. 16 දින 0900 පැයේ සිට 2018.07.31 දින 1000 පැය දක්වා | 2018.07.31 දින 1030 පැයට |
| 5 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය යුද්ධ හමුදා කඳවුර, කන්කසන්තුරය | ට්‍රක් රථ, බස් රථ, ගලි රථ, සින්ගල්/ඩබල් කැබ් රථ, ජීප් රථ, ජල බවුසර්, ට්‍රැක්ටර්, අත් ට්‍රැක්ටර්, ධාවන පැදි, ගිලන් රථ, ත්‍රි රෝද රථ | 01 සිට 50 දක්වා (වාහන)<br>01 සිට 06 දක්වා (පොදු භාණ්ඩ) | 2018.07. 16 දින 0900 පැයේ සිට 2018.08.07 දින 1000 පැය දක්වා | 2018.08.07 දින 1030 පැයට |
| 6 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය යුද්ධ හමුදා කඳවුර, කිලිනොච්චි | ධාවන පැදි, සින්ගල් කැබ් රථ | 01 සිට 07 දක්වා (වාහන)<br>01 සිට 07 දක්වා (පොදු භාණ්ඩ) | 2018.07. 16 දින 0900 පැයේ සිට 2018.08.08 දින 1000 පැය දක්වා | 2018.08.08 දින 1030 පැයට |
| 7 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය යුද්ධ හමුදා කඳවුර, මුලතිව් | ට්‍රක් රථ, සින්ගල් කැබ් රථ, ට්‍රැක්ටර්, අත් ට්‍රැක්ටර්, අත් ට්‍රැක්ටර් ටේලර්, ධාවන පැදි | 01 සිට 11 දක්වා (වාහන)<br>01 සිට 04 දක්වා (පොදු භාණ්ඩ) | 2018.07. 16 දින 0900 පැයේ සිට 2018.08.09 දින 1000 පැය දක්වා | 2018.08.09 දින 1030 පැයට |
| 16 වැඩපල ශ්‍රී ලංකා ඉංජිනේරු රෙජිමේන්තුව, යුද්ධ හමුදා කඳවුර, මත්තෙගොඩ | පොදු භාණ්ඩ | 01 සිට 03 දක්වා (පොදු භාණ්ඩ) | 2018.07. 16 දින 0900 පැයේ සිට 2018.08.02 දින 1000 පැය දක්වා | 2018.08.02 දින 1030 පැයට |

2. **ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා ඉදිරිපත්කර ඇති වාහන/පොදු භාණ්ඩ පරීක්ෂා කිරිම හා අයදුම්පත් ලබාගත හැකි කාලසීමාව වනුයේ 2018.07.16 දින 0900 පැයේ සිට 2018.07.24 දින 1600 පැය දක්වා වේ. (සති අන්ත හා රජයේ නිවාඩු දින හැර)**

3. **ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා අසාදු ලේඛණ ගතකර ඇති අයවළුන් හට ඉදිරිපත් විය නොහැක.**

4. ප්‍රසම්පාදන අයදුම්පත් අදාල වාහන/පොදුභාණ්ඩ එක්රැස්කර ඇති භූමියේ ස්ථාපිතකර ඇති කාර්යාලයෙන් මිලදිගත හැක. ප්‍රසම්පාදන අයදුම්පත් සඳහා **එක් ලොට් එකක් වෙනුවෙන් ආපසු නොගෙවනු ලබන රු: 500/= (රුපියල් පන්සියක) මුදලක්** අය කරන අතර එම මුදල එම ස්ථානයේ සිටින මුදල් අයකැමි වෙත ගෙවීමෙන් අවශ්‍ය ප්‍රසම්පාදන අයදුම්පත් ලබාගත හැක. වාහන/පොදුභාණ්ඩ සඳහා වෙන වෙනම ප්‍රසම්පාදන අයදුම්පත් ලබාගත යුතුවේ. (උදා: වාහන අයදුම්පතක් මගින් පොදුභාණ්ඩ සඳහා මිලගණන් ඉදිරිපත් කල නොහැක) **එක් ගැණුම්කරුවෙකු ලොට් කිහිපයකට මිලගණන් ඉදිරිපත් කරන්නේනම් ඒ සඳහා වෙන වෙනම ප්‍රසම්පාදන අයදුම්පත් මිලදී ගත යුතු අතර, එක් ප්‍රසම්පාදන අයදුම්පතකින් ඉදිරිපත් කල හැක්කේ එක් ලොට් අංකයකට අදාල මිලගණන් පමණකි. එසේ නොමැති ප්‍රසම්පාදන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

5. **වාහන සහ පොදුභාණ්ඩ සඳහා අදාල වන ඇප තැන්පතු (ආපසු ගෙවනු ලබන) ප්‍රමාණයත් ඇතුලත් වගුවක් වාහන/පොදුභාණ්ඩ අයදුම්පතෙහි ඇතුලත්වේ. ඒ අනුව සෑම වාහන/පොදුභාණ්ඩ ලොට් එකක් සඳහාම වෙන් වෙන් වශයෙන් ඇප තැන්පතු** ඉදිරිපත් කල යුතු අතර එම ඇප මුදල එම ස්ථානයේ සිටින මුදල් අයකැමි වෙත ගෙවීමෙන් පසු **ලැබෙන කුවිතාන්සිය (මුල් පිටපත) අනිවාර්යයෙන්ම අදාල අයදුම්පත සමග** අමුණා ඉදිරිපත්කල යුතුය. **ඇප කුවිතාන්සිය ඉදිරිපත් නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

6. අයදුම්පත් ඉදිරිපත් කිරිමේදි රථ වාහන/පොදුභාණ්ඩ වල ඉදිරියේ සටහන් කර ඇති ලොට් අංකය **අනිවාර්යයෙන්ම අයදුම්පතෙහි හා අයදුම්පත් බහාලන කවරයේ වම් ඉහල කෙලවරේ** පහත සඳහන් අයුරින් සටහන් කල යුතුය.

**අ. ලොට් අංකය : ……………… ආ. ප්‍රසම්පාදනය විවෘත කරන දිනය : 2018 …………… දින ඇ වාහන/පොදු භාණ්ඩ වර්ගය :** ……….…………………..

7. ප්‍රසම්පාදන පෙට්ටි තබා ඇති ස්ථානය හා **අයදුම්පත් ලියාපදිංචි තැපැලෙන් එවන්නේනම් එවිය යුතු ලිපිනය පහත දක්වා ඇත.** රථ වාහන/පොදුභාණ්ඩ සඳහා වෙන වෙනම පෙට්ටි වෙන්කර තබා ඇති අතර එම පෙට්ටි සතියේ වැඩ කරන දිනවල (සති අන්ත හා රජයේ නිවාඩු දිනවල හැර) උදෑසන 0900 පැයේ සිට 1600 පැය දක්වා නියෝජිතයෙකු භාරයේ පහත දක්වා ඇති ස්ථානයන්හි තබා ඇත. **අයදුම්පත් පෙට්ටි වලට බහාලීමට ප්‍රථම එම ස්ථානයේ සිටින නියෝජිත භාරයේ තබා ඇති රෙජිස්ටරයේ ලේඛණ ගතකර අදාල පෙට්ටියට බහාලිය යුතුය. වාහන අයදුම්පත් වාහන පෙට්ටියටද, පොදුභාණ්ඩ අයදුම්පත් පොදුභාණ්ඩ පෙට්ටියටද බහාලිය යුතු අතර, අදාල නොවන පෙට්ටියකට බහාලන ලද අයදුම්පත් ප්‍රතික්ෂේපිත අයදුම්පත් සේ සලකනු ලබයි.**

| ස්ථානය | ප්‍රසම්පාදන පෙට්ටි තබා ඇති ස්ථානය | අයදුම්පත් එවිය යුතු තැපැල් ලිපිනය | ප්‍රසම්පාදන විවෘත කරනු ලබන ස්ථානය |
|---|---|---|---|
| 1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය, යුද්ධ හමුදා ජනපදය, පනාගොඩ, හෝමාගම | ආරක්ෂක සේනා මුලස්ථානය (බටහිර) යුද්ධ හමුදා ජනපදය, පනාගොඩ, හෝමාගම (ප්‍රධාන දොරටුව අසල) | ටෙන්ඩර් මණ්ඩල සභාපති 1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය, යුද්ධ හමුදා ජනපදය, පනාගොඩ, හෝමාගම | බෝධිරාජාරාමය යුද්ධ හමුදා ජනපදය, පනාගොඩ, හෝමාගම |
| 2 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය, යුද්ධ හමුදා කඳවුර, රණසේවාපුර, අනුරාධපුර | 2 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකා (ප්‍රධාන දොරටුව අසල) | ටෙන්ඩර් මණ්ඩල සභාපති 2 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය, යුද්ධ හමුදා කඳවුර, රණසේවාපුර, අනුරාධපුර | 2 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය යුද්ධ හමුදා කඳවුර, රණසේවාපුර, අනුරාධපුර |
| 3 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය, යුද්ධ හමුදා කඳවුර, මහසෙන්පුර, මින්නේරිය | 3 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකා (ප්‍රධාන දොරටුව අසල) | ටෙන්ඩර් මණ්ඩල සභාපති 3 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය, යුද්ධ හමුදා කඳවුර, මහසෙන්පුර, මින්නේරිය | 3 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය යුද්ධ හමුදා කඳවුර, මහසෙන්පුර, මින්නේරිය |
| 5 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය, යුද්ධ හමුදා කඳවුර, කන්කසන්තුරය | 5 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකා (ප්‍රධාන දොරටුව අසල) | ටෙන්ඩර් මණ්ඩල සභාපති 5 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය, යුද්ධ හමුදා කඳවුර, කන්කසන්තුරය | 5 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය යුද්ධ හමුදා කඳවුර, කන්කසන්තුරය |
| 6 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය, යුද්ධ හමුදා කඳවුර, කිලිනොච්චි | 6 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකා (ප්‍රධාන දොරටුව අසල) | ටෙන්ඩර් මණ්ඩල සභාපති 6 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය, යුද්ධ හමුදා කඳවුර, කිලිනොච්චි | 6 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය යුද්ධ හමුදා කඳවුර, කිලිනොච්චි |
| 7 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය, යුද්ධ හමුදා කඳවුර, මුලතිව් | 7 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකා (ප්‍රධාන දොරටුව අසල) | ටෙන්ඩර් මණ්ඩල සභාපති 7 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය, යුද්ධ හමුදා කඳවුර, මුලතිව් | 7 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය යුද්ධ හමුදා කඳවුර, මුලතිව් |
| 16 වැඩපල ශ්‍රී ලංකා ඉංජිනේරු රෙජිමේන්තුව, යුද්ධ හමුදා කඳවුර, මත්තෙගොඩ | 16 වැඩපල ශ්‍රී ලංකා ඉංජිනේරු රෙජිමේන්තුව, යුද්ධ හමුදා කඳවුර, මත්තෙගොඩ (ප්‍රධාන දොරටුව අසල) | ටෙන්ඩර් මණ්ඩල සභාපති 16 වැඩපල ශ්‍රී ලංකා ඉංජිනේරු රෙජිමේන්තුව, යුද්ධ හමුදා කඳවුර, මත්තෙගොඩ | බෝධිරාජාරාමය යුද්ධ හමුදා ජනපදය, පනාගොඩ, හෝමාගම |

8. සෑම අයදුම්පතක්ම නිසි අයුරු සම්පූර්ණ කර කවරයක බහා ඉහත දක්වා ඇති ස්ථානයේ තබා ඇති නිවැරදි පෙට්ටි වලට නියමිත දින හා වේලාවට ප්‍රථම පුද්ගලිකව බහාලීමට හෝ ලියාපදිංචි තැපැලෙන් එවීමට කටයුතු කල යුතුය. **අයදුම්පත් භාරගන්නා අවසාන දිනය හා වේලාව ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

9. **අයදුම්පත් විවෘත කරන අවස්ථාව සඳහා අනන්‍යතාව සහතික කල හැකි ජාතික හැඳුනුම්පත/විදේශ ගමන් බලපත්‍රය/ රියදුරු බලපත්‍රය සහිතව ගැණුම්කරු** හෝ **ගැණුම්කරු සහභාගි නොවන්නේ නම් ඔහු වෙනුවට බලය පවරන ලද නිත්‍යානුකූල ලිපියක් සහිතව නියෝජිතයෙකු අනිවාර්යයෙන්ම සහභාගි කරවීමට** ක්‍රියා කල යුතුය.

10. **සැලකිය යුතු කරුණු :**

අ. තිරු බද්දෙන් නිදහස් වාහන මිලදි ගන්නා ගැණුම්කරුවන් විසින් අදාල වාහනය නිදහස් කර ගැනිම සඳහා තිරු බදු මුදල් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තුමේන්තුවට ගෙවීමට කටයුතු කල යුතු අතර තිරු බදු නිදහස්ව ආනයනය කල වාහන පිලිබඳ විස්තර අදාල ශ්‍රීලයුයුබ ඒකක වෙතින් දැණුම් දෙනු ඇත.

**ආ. සුන්බුන් වාහන හැර අනෙකුත් වාහන මිලදි ගන්නා ගැණුම්කරුවන් විසින් එම වාහන කඳවුරු භූමිය තුලින් ඉවත්කර ගැනිමට ප්‍රථම අදාල කඳවුරේ නියෝජිතයන් විසින් ලබාදෙන ලියකියවිලි සමග වාහනයේ චැසි/එන්ජින් අංක නිවැරදිව ඇති බවට තහවුරුකර ගැනිමෙන් අනතුරුව වාහන ඉවත්කර ගත යුතුය. (කඳවුරු භූමිය තුලින් වාහන ඉවත්කර ගත් පසු ඇතිවන ගැටළු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් වගකියනු නොලැබේ)**

11. මෙම ප්‍රසම්පාදනය සැබඳිව **ඉහත සඳහන් කොන්දේසි හා අයදුම්පත් වල දක්වා ඇති කොන්දේසි** හොඳින් කියවා බලා තේරුම් ගෙන ඒවාට අනුකූලව ප්‍රසම්පාදන අයදුම්පත් ඉදිරිපත් කිරිම හා ක්‍රියාකිරීම අයදුම්කරුවන් සතු වගකිම බව අවධාරණය කරන අතර ප්‍රසම්පාදනය පිලිබඳ අවසාන තිරණය ප්‍රසම්පාදන මණ්ඩල සභාපති සතුවේ. මේ පිලිබඳ වැඩිවිස්තර යුද්ධ හමුදා මුලස්ථානයේ දුරකථන අංක: 011-2987525 වෙතින් හා යුද්ධ හමුදා වෙබ් අඩවියෙන් (www.army.lk) ලබාගත හැක.

**යුද්ධ හමුදාධිපති**